# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,811/7 — 1968 ජූලි 26 වැනි සිකුරාදා — 1968.7.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අංකය : 543 ඊ/115 ඩී

### කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති, පහත දැක්වෙන කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1968 ජූලි මස 25 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

### කාර්යාල සේවක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

මෙ ව්‍යවස්ථා සංග්‍රහය 1968 අගෝස්තු 1 දින වලංගු විය යුතුය. මෙ දිනයෙහිත්, ඊට පසුවත්, රජයේ දෙපාර්තමේන්තුවකට අයත් යම් කාර්යාලයක මෙ ව්‍යවස්ථා සංග්‍රහයට යාකොට ඇති " එස් " උපලේඛනයෙහි දක්වා ඇති ඕනෑම තනතුරක ඇතිවෙන සියළුම ඇබෑර්තු මෙ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට අනුකූලව පුරවනු ලැබිය යුතුය.

1. වැටුප් ක්‍රමය, නිර්මාණ ආකෘතිය සුසංයෝජිතවූ පත්කිරීම.—කාර්යාල සේවක සේවය, යට දක්වා ඇති සේවයට අයත් පන්තිවලින් ඕනෑම එකකට පත් කරනලද නිලධාරීන්ගෙන් සමන්විත වියයුතුය.


USE ONLY FO[illegible] ...CH.


**වාර්ෂික වැටුප් ක්‍රමය**

I වැනි පන්තිය ... රු. 750 — 42 × 13 — රු. 1,296

II වැනි පන්තිය ... රු. 540 — 30 × 8 සහ 24 × 1 — රු. 804

III වැනි පන්තිය ... රු. 480 — 30 × 4 සහ 24 × 1 — රු. 624

2. මෙ ව්‍යවස්ථා සංග්‍රහයට යාකොට ඇති " එස් " උපලේඛනයෙහි I, II සහ III යන පන්ති යටතේ සඳහන් කොට ඇති තනතුරු පිළිවෙලින් කාර්යාල සේවක සේවයේ I වැනි, II වැනි සහ III වැනි පන්තිවලට අයත් නිලධාරීන් විසින් සාමාන්‍යයෙන් උසුලනු ලැබේ. රජයේ කාර්යාලවල වෙනත් තනතුරුද කලින් කලට ස්වකීය අභිමතය පරිදි මෙ උපලේඛනයට ඇතුළත් කිරීමට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට හැකිය.

3. (i) III වැනි පන්තියට බඳවාගනු ලබන්නේ, පුරප්පාඩු ඇතිවන පරිදි ලඟින්ම පිහිටි රැකීරක්ෂා කාර්යාලයෙන් කැඳවනු ලබන අයදුම්කරුවන් අතුරෙන්, ඒ ඒ ඇබෑර්තු පවතින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසිනි. එසේ බඳවාගනු ලැබීම සඳහා සුදුසුකම් වනුයේ —

(අ) අධ්‍යාපනික සුදුසුකම් ... හයවැනි ප්‍රමාණයට නොඅඩු

(ආ) වයස ... අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි වීම

(ඇ) චරිතය ... විශිෂ්ඨ.

ස්ථිර ලේකම්වරයා, සිය අමාත්‍යාංශ කාර්යාලයේ පුරප්පාඩු සම්බන්ධයෙන් පත්කිරීමේ බලධාරියා වනු ඇත.

(ii) II වැනි පන්තියේ පුරප්පාඩු III වැනි පන්තියෙන් උසස් කිරීමෙන් පුරවනු ලැබේ. III වැනි පන්තියේ වැටුප් ක්‍රමයෙහි උපරිම වැටුප මත එක අවුරුද්දක් සේවය කර ඇත්තාවූ ද සතුටුදායක සේවා වාර්තාවක් ඇත්තාවූද III පන්තියේ නිලධාරීහු, II පන්තියට උසස් කරනු ලැබීම සඳහා සුදුසුවෙත්. II වැනි පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම් ඇති යෝග්‍ය නිලධාරීන් III වැනි පන්තියෙහි නොමැතිවූ විට පුරප්පාඩුව පවත්නා දිස්ත්‍රික්කය ඇතුළෑ දැන්වීම ප්‍රසිද්ධ කර කෙළින්ම බඳවා ගැනීමෙන් II වැනි පන්තියේ පුරප්පාඩු පුරවනු ලැබේ. එසේ බඳවාගනු ලැබීම සඳහා සුදුසුකම් වනුයේ —

(අ) අධ්‍යාපනික සුදුසුකම් ... ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ පොදු අධ්‍යයන සහතික පත් විභාගයේ විෂයයන් 6 කින් සාමාර්ථ...

(ආ) වයස ... අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩිවීම

(ඇ) චරිතය ... විශිෂ්ඨ

(සටහන.—දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි ඉහත දැක්වුණු වයස් සීමාව බලනොපවත්වනු ඇත.)

iii) I වැනි පන්තියට ශ්‍රෙණි ගතකර ඇති තනතුරුවල පුරප්පාඩු, II වැනි පන්තියට අයත් යෝග්‍ය නිලධාරීන් උසස් කිරීමෙන්, භාණ්ඩාගාරයේ ලේකම් විසින් පුරවනු ලැබේ. I වැනි පන්තියට උසස් කරනු ලැබීමට සුදුසුවීමට පළමු නිලධාරීන් II වැනි පන්තියට සියමිත උපරිම වැටුපට උපරිම වැටුප මත අවුරුද්දක් සේවය කර තිබිය යුතුය.

iv) උසස් කිරීම සඳහා නිලධාරීන්ගේ යෝග්‍යත්වය නිශ්චය කිරීමේදී, ජ්‍යෙෂ්ඨතාව මෙන්ම කාර්යක්ෂමතාව, පැමිණීමේ ක්‍රමවත් භාවය, නියම පැමිණීම, විශ්වාස කටයුතු බව, යන කරුණු ගැන සැළකිල්ල දක්වනු ලැබේ.

v) III වැනි පන්තියට පළමුවෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් 3 (i) උප ඡේදයෙහි නියමිත විධිවිධානවලට යටත්ව, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය විසින් කාර්යාල සේවක සේවය පරිපාලනය කරනු ලැබේ.

1. සේවා කොන්දේසි.—(i) සේවයට පත්කරන ලද හෝ අන්තර්ග්‍රහණය කරන ලද හෝ සියළුම නිලධාරීහු, දිවයින ඇතුළත ඕනෑම ස්ථානයකට යවනු ලැබීමට යටත්විය යුත්තාහ.

(ii) "එස්" උපලේඛනයෙහි දක්වා ඇති වෙන් වෙන් තනතුරු සම්බන්ධයෙන් අදාළවන රාජකාරී පැ ගණන්, නිවාඩු, අතිකාල දීමනා, විශේෂ වැනි සේවා කොන්දේසි, මෙම සේවය පිහිටුවනු ලැබීමට පූර්වාසන්නව ඒ ඒ තනතුරු කෙරෙහි බලපැවැත්වූ සේවා කොන්දේසිම වනු ඇත.

5. මාරු කිරීම.—දෙපාර්තමේන්තුවක වෙනස් ආයතනයන් අතර නිලධාරීන් මාරුකිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කරනු ලැබේ. ංශයේ දෙපාර්තමේන්තු අතර නිලධාරින් මාරුකිරීම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා විසින්ද, අමාත්‍යාංශයන් අතර නිලධාරීන් මාරුකිරීම භාණ්ඩා නියෝජ්‍ය ලේකම් විසින් ද කරනු ලැබේ.

6. සේවයේ සියළුම නිලධාරීහු, තමන් අයත්වන පන්තියේ තනතුරුවලට හෝ සැසඳිය හැකි ගණයකට හෝ නියමිත ඕනෑම රාජකාරියක් ඉටු බැඳී සිටින්නාහ.

7. සේවය කරන නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම.—ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක, මේ ව්‍යවස්ථා සංග්‍රහයට යාකොට ඇති "එස්" උප යේ දක්වා ඇති තනතුරුවල ස්ථිර පත්වීම් උසුලන සියළුම නිලධාරීහු පහත සඳහන් ආකාරයට කාර්යාල සේවක සේවයට අන්තර්ග්‍රහණය කරනු —

(i) ස්වකීය තනතුරු සේවයේ I වැනි පන්තියට ඇතුළත් කරනු ලැබ ඇත්තාවූ, සියළුම නිලධාරීහු සේවයේ I වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබති.

(ii) ස්වකීය තනතුරු සේවයේ II වැනි පන්තියට ඇතුළත් කරනු ලැබ ඇත්තාවූ, සියළුම නිලධාරීහු සේවයේ II වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබති.

(iii) ස්වකීය තනතුරු සේවයේ III වැනි පන්තියට අයත් වන්නාවූ, සියළුම නිලධාරීහු සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබති.

8. නිලධාරීන් සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීමේදී, ඔවුන්ගේ වැටුප් මු.රෙ. 1120 යටතේ නිශ්චය කරනු ලැබේ. නියමිත දිනයෙහි තමාට වූ වැටුප් ක්‍රමයට අඩු වාසි ගෙනදෙන වැටුප් ක්‍රමයක් ඇති පන්තියකට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරියෙකුට අන්තර්ග්‍රහණය කරනු ලැබූ අවධි මාගේ තනතුරට තිබූ වැටුප් ක්‍රමය තමාට පෞද්ගලික වනසේ තබා ගැනීමට අවසර දෙනු ලැබේ.

9. සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධී ජ්‍යෙෂ්ඨතාව පහත සඳහන් පදනම මත නිශ්චය කරනු ලැබේ :—

(i) සේවයේ I වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධී ජ්‍යෙෂ්ඨතාව, වර්ෂයකට රු. 750 ක ආරම්භක වැටුපක් හිමි යම් තනතුරක කර ඇති සේවා කාලයේ දීර්ඝත්වය මත පදනම් කරනු ලැබේ.

(ii) සේවයේ II වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධී ජ්‍යෙෂ්ඨතාව, වර්ෂයකට රු. 540 ක ආරම්භක වැටුපක් හිමි යම් තනතුරක කර ඇති සේවා කාලයේ දීර්ඝත්වය මත පදනම් කරනු ලැබේ.

(iii) සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධී ජ්‍යෙෂ්ඨතාව, වර්ෂයකට රු. 480 ක ආරම්භක වැටුපක් හිමි යම් තනතුරක කර ඇති සේවා කාලයේ දීර්ඝත්වය මත පදනම් කරනු ලැබේ.

10. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ "එස්" උපලේඛනයෙහි වර්ග කොට ඇති තනතුරු දැනට උසුලන්නාවූ ද, කාර්යාල සේවක සේවයට අන්තර්ග්‍රහණය ලැබීමට නොකැමති වන්නාවූද සියළුම නිලධාරීන්ට, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමේ පළකර සිටීමට ඉඩදෙනු ලැබේ. ඒ මනාපය, මෙම ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන දිනයෙහි සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයක් ඇතුළත සිටිය යුතුය.

11. මේ ව්‍යවස්ථා සංග්‍රහයේ අර්ථ නිරූපනය පිළිබඳ සැම ප්‍රශ්නයක්ම භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. ව්‍යවස්ථා සම්බන්ධයෙන් අවශ්‍ය යම් සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් කරනු ලැබේ.

## "එස්" උපලේඛනය

### කාර්යාල සේවක සේවයට ඇතුළත් කරන ලද තනතුරු

**I වැනි පන්තිය**

දුරකථන ක්‍රියාකරුවෝ
ලේඛන භාරකරුවෝ
පොත් බඳින්නෝ
පිටපත් යන්ත්‍ර ක්‍රියාකරුවෝ

**II වැනි පන්තිය**

ආරච්චිවරු
කාර්යාල කාර්ය සහායකයෝ
බයිසිකල් සේවකයෝ
සෝපාන ක්‍රියාකරුවෝ
පණිවුඩකරුවෝ
මුරකරුවෝ (කාර්යාලය)

**III වැනි පන්තිය**

කාර්යාල කම්කරුවෝ
උද්‍යාන කම්කරුවෝ
අමදින්නෝ

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.